පේරාදෙණිය විශ්වවිද්‍යාලය
**UNIVERSITY OF PERADENIYA**

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (පැරණි නිර්දේශය) - (නොවැම්බර්/දෙසැම්බර් 2019)**

GENERAL DEGREE EXAMINATION IN ARTS (Old Syllabus) – (November /December 2019)

**SINHALA II ( SLG 2 )**
**( පැරණි ගද්‍ය සාහිත්‍යය, භාෂාව හා ව්‍යාකරණය )**

**කාලය පැය තුනයි (03).**
පළමු වන හා නව වන ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

II, III කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගත යුතු ය.

නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපනු ලැබේ.
මෙහි අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව (09) නවයකි.

---

I කොටස

(1) (අ) පහත දැක්වෙන පාඨ තුන (03) ලිහිල් බසින් ලියන්න. (ලකුණු 10 + 8 + 7 = 25)

(ආ) පහත දැක්වෙන පාඨ තුනෙහි (03) ඉරි ඇඳි පද අතුරින් පහකට විවරණ සපයන්න.

(ලකුණු 3 x 5 = 15)

i.

රජ සැදෑහැ[5] නැත්තෙ යැ. දුශ්ශීල යැ. දුශ්ශීලය හට සීලකථා කතා, යහුල්[6] දෙන කල් වැනි වෙයි. එසින් රජ, "මම මොවුන් සඟතෙම්,යි ආමෙයමි. මොහු මා 'ආ තැන් පටන් ගෙනැ බවීජ පිරිස් මැද තෙපුල් ගෙනෙති, මොවුනට කළමිනා[7] දන්මි." යි සිතා බණ සමහර කළ කලැ, "සෙට මා ගෙ ගෙහි[8] වළඳන්නට වඩනෙයැ"යි කියා ගියෙය. දෙවන[9] දවස් මහත් මගත් සැළි[10] ගෙන්වා ගෙනැ එහි අසුචි පුරවා කේල්පතින්[11] මුව වසා බඳවා[12] තන්හි තන්හි තැබැවී යැ.[13] බොල් මී තෙල් හා කුඹුක්[14] තෙලපුල් හා කෙළෙඹි පුරවා හිණිහියැ තැබැවී යැ. මල්ලවයන් කැඳවා ගෙනැ, "තෙප්[15] කැසපට ගළා හැඳැ මුගුරු ගෙනැ හිටැ කුටතාපසයන් පසයින් බස්නා කලැ කෙළෙඹින් බොල්පුල්[16] හිණි හිසැ සිටැ වටා[17] පියා හිසැ මුගුරෙන් පැහැර බැර අත්ලා[18] ගෙනැ හිණැ හෙළා සියව"යි යෙදී යැ. හිණි[19] ... කැකුළු බල්ලන් බඳවා සිටිවී. තව්සොද්, "සෙට රජගෙහි වළඳන්නට ගිය මැනැවැ. රජගෙ නම්, සාසඞ්ක යැ. සභය යැ. පැවිජියන් විසින් සඳෙරට හමුවූ සඅරමුණෙහි සසැඳෙම[20] ඇති වියැ යුත්තෙ යැ. දුව දූව[21] අරමුණෙහි නිමිත්[22] නො ගත යුත්තෙ යැ"යි ඔවුනොවුනට[23] අවවා දී ... පෙළා බලා තවුස් පිරිකර ධරා[24] භික්ෂාභාජන ගෙනැ පිළිවෙළින් රජගෙට නැංගාහු.

(**අමාවතුර**, කෝදාගොඩ ඤාණාලෝක හිමි සංස්. 68 පිටුව)

ii.

පෙර තුන්බෑ කෙනෙක් වල් ගොස් මී සලා මී වෙළදාම් කොට ජීවත්වෙති. දවසෙක මහලු දෙබෑයන් මී සලා වලට යාදී ගමනුත් මල්, පිල හිඳ මී විකුණනුයේ, ශීලත් භික්ෂු කෙනකුන් දැක මී පාත්‍රයක් පුරා දන් දී සවස මහලු දෙබෑයන් ගෙට ආ කල "සත් හුත් ගුණෙන් යුත් ශීලත් මහණ කෙනෙකුන් දැක මී පාත්‍රයක් දන් දින්මි, පින අනුමෝ වව"යි කී ය. එ බස් අසා මහලු දෙබෑයෝ "අපි වල ඇවිද මී සොයා දුක් ගතුමෝ ද, තෝ ගම හිඳ දිය මී කෙරෙ ද"යි කිපි එකෙක් "තාගේ මහණු ගෙන සැඬොල්ගම ලා පියව"යි කී ය. එකෙක් කියනුයේ "තාගේ මහණු ගෙන මුහුදිනා එතෙර ලා පියව"යි කී ය. එබසට මල්, මුයෙන් නො බැන ඉවසා පසුව දෙදෙනා සත්හුන් කල අවවාද කියා කළ පින් දෙදෙනා ම සමාදන් කැරවිය. ඒ පිනින් පසු ජාතියෙහි මල්, මුළු දඹදිවට අග රජ ව ධර්මාශෝක නම් රජ විය. සැඬොල්ගම ලා පියව යි කී බෑහැ ඒ ජාතියෙන් මිය රජක් හට දව, තිසොවක බඩ හෙව, සාඬොල් ගම් මැදෙක තුග ගසක් මුල අනාථ ව ඉපැද වැඩී පසුව සමාදන් වූ පිනින් බුදුසසුන් වැද මහණව අමාමහ නිවන් දැක නිග්‍රොධ නම් මහතෙර විය. අනික් බෑහැ මුහුදින් එ තෙර ලා පියව යි කී පවින් දඹදිව නො ඉපැද ලක්දිව මුටසීව රජහට පුත් ව දෙවන පැතිස් රජ ව, සිරිලක ඔටුන් පැළඳ අභිෂෙකව, දන සමාදන ඵලයෙන් ඉතා මහත් වූ පින්බල ඇති වී ය යි දතයුතු. එසේ හෙයින් කියන ලදී-

(**පූජාවලිය**, කිරිඇල්ලේ ඤාණවිමල සංස්. 758 පිටුව)

iii.

තව ද ඒ චණ්ඩාශෝක රජ්ජුරුවන් ඔටුනු පැළඳි සතරවන අවුරුද්දෙහි ඔවුන්ගේ සහෝදර මල් වූ යුවරජ තනතුරෙහි සිටි තිස්ස නම් රාජකුමාරයන් හා සංඝමිත්‍රාවන්ගේ ස්වාමිපුත්‍ර වූ අග්ගිබ්‍රහ්ම නම් රාජකුමාරයන් හා දෙදෙන ලක්ෂයක් පුරුෂයන් හා සමග සසුන් වැද මහණ ව රහත් වූහ. ඉක්බිති ඒ චණ්ඩාශෝක රජ්ජුරුවෝ දවසෙක ඇමැතියන් කැඳවා "එම්බා සගයෙනි, මම බුදුන් සර්වඥයන් උපනිම් නම් මුළු දඹදිව රාජ්‍යය බුදුන්ට පූජා කෙරෙමි. දෙව්රජ ව උපනිම් නම් දිව්‍යරාජ්‍යයෙන් පූජා කෙරෙමි. දැන් මා එවැනි පිනක් කොටගන්ට පින් මඳ හෙයින් අද හෝ දිවමනු බුදුන් දක්නා දෙනුවන් සිත්වාහක නුනුණුයෙමි. බුදුන් අදුනන කෙනෙක් ඇද් ද"යි විචාළහ. එකල ඇමැතියෝ "මහරජ, දැන් බුදුන් පිරිනිවියේ දෙසිය එක්විසි හවුරුද්දෙක. පුරුෂයුග දෙකක් ඉක්මෙමින් සිටියේය. එසේ හෙයින් බුදුන් අදුනන මිනිෂ්‍ය කෙනෙක් නැත. මංජේරික නම් නාගභවනයෙහි පාතාලවාසි වූ මහාකාළ නම් නාරජ්ජුරුවෝ කල්පයකට ආයු ඇතියහ. මේ කප බුදු වූ සතරදෙනා වහන්සේ ම දුටහ. බුදුවෙස් මවා දක්විත්ට සුදුසු වූ මහත් ආනුභාව ඇතියහ" යි කීහ. එබස් අසා රජ්ජුරුවෝ "ඒ නාරජු ගෙන්වා බුදුන්ගේ රූපශ්‍රී බලමි"යි සිතා රන් ඇකිල්ලක් කරවා තමන් අතින් ගෙන "සැබැවින් මම තුනුරුවන් කෙරෙහි පහන්සිත් ඇතියෙම් වීම් නම් මේ මට යබා ගුඩාවෙස් ඇත්නම් මේ ඇකිල්ල වහා දිවගෙන ගොස් ඒ මහාකාළ නම් නාරජු බද ගෙනෙව"යි සත්‍යක්‍රියා කොට තමන්ගේ තෙජෝගුණය ද පලකා බිමට දැමූහ. එකෙණෙහි ඒ ඇකිල්ල කිහිපි පැකිල්ලක් නැති ව මහපොළොව දෙබේ කෙරෙමින් ඇකිල්ලක දිවගෙන ගොස් ඒ මහාකාළ නම් නාරජහුගේ වාලධිය පැහැර හිණ. නාරජ ඇකිල්ල දැක තිමෙන් දෙ! කොයි දිවසින් බලා රජ්ජුරුවන්ගේ අචල වූ ශ්‍රද්ධාබලය හා තෙජෝබලය දැක තම ඇකිල්ලෙහි දහස් ගණන් නානරුවන් පිරිවරා නාගභවනයෙන් නික්ම රාජාංගනයෙහි මහපොළොව පළාගෙන ලව නැඟී රජ්ජුරුවන්ට අභිමුඛ ව දෘශ්‍යමාන රූපයෙන් මහජනයාට පෙනි පෙනි සහපිරිවරින් සිටගත. රජ්ජුරුවෝ පිරිවර සහිත ඒ මහාකාළ නම් නාරජ්ජුරුවන් දැක "තෙපි කවුරු දැයි විචාරා නත් වූ පරිද්දෙන් නාරජ්ජුරුවන් බිව් දැන "බුදුන් දුටු ද"යි විචාරා "එසේය මහරජ, දිටිමි"යි කී කල්හි

(**සද්ධර්මාලංකාරය**, ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම, 312 පිටුව)

## II කොටස

(2) අමාවතුරේ රචනා රීතිය නූතන විචාරකයන්ගේ සම්භාවනාවට ලක්වීමට තුඩු දුන් හේතු සාධක පිළිබඳ විවරණයක යෙදෙන්න.

(3) සන්දර්භය විෂයයෙහි ලා සලකන කල අමාවතුර සම්භාව්‍ය සිංහල ගද්‍ය සාහිත්‍යයෙහි විශිෂ්ටතම කෘතිය ලෙස සැලකීමට බලපෑ හේතු පැහැදිලි කරන්න.

(4) "පූජාවලිය පුළුල් පාඨක පිරිසක් අරමුණු කරගත් කෘතියකි." විමසන්න.

(5) "සද්ධර්මාලංකාරය, සැදැහැවත් උවසු උවැසියන් ශ්‍රද්ධා භක්තියෙන් පිනවන සුලු මෙන් ම විචාරවක් පාඨකයා නුරුස්නා සුලු කරුණුවලින් ගහනය." පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වන්න.

## III කොටස

(6) සිදත් සඟරා ලිංග විග්‍රහයේ ඌනාධිකතා පිළිබඳ සමාලෝචනයක් කරන්න.

(7) සිදත් සඟරා විබත් අදියර ව්‍යාකූල වීමට තුඩු දුන් හේතු පිළිබඳ විවරණයක යෙදෙන්න.

(8) ව්‍යවහාර සිංහලයේ ක්‍රියා පදය හඳුනාගැනීමට සිදත් සඟරාවේ කිරිය අදියරෙන් ලැබෙන පිටිවහල පිළිබඳ සමාලෝචනයක් කරන්න.

(9) පහත දැක්වෙන වාක්‍යවල සදොස් තැන් ඇතොත් ඒවා නිදොස් කර ලියන්න.

i. ඔවුන් දෙදෙනා මෙසේ හමුවන බව නගරයේ කිසිවෙක් නොදනී.
ii. ඉක්බිති ඔවුන් තම තමන්ගේ වතගොත ගැන කතාකරන්නට වූහ.
iii. මිනිසුන් යුද්ධවලට පොළඹවනු ලබති.
iv. ඉදිරි පේළියේ මුලින් සිටින්නේ ඔලිම්පික් පදක්කම් ලාභිනියයි.
v. අලි ඇත්තු හවභෝග වනසතියි ගොවියන් මැසිවිලි නගති.
vi. ඊයේ පංති වර්ජනය නිසා ශිෂ්‍යයෝ දේශනවලට පැමිණියේ නැත.
vii. ඇයත් මමත් මෙවර උසස් පෙළ විභාගයෙන් සමත් වුනෙමි.
viii. පියා නොහොත් තාත්තා පවුලේ ගෘහ මූලිකයා වේ.
ix. සියළු ඥාති මිත්‍රාදීන් මේ කණගාටුදායක නිවේදනය පිළිගනිත්වා.
x. ඔවුන් ප්‍රඥාවන්තයන් නම් දේශපාලනඥයන්ගේ ප්‍රෝඩාවලට අසු නොවනු ඇත.

(2 සිට 9 දක්වා පිළිතුරුවලට උපරිමය ලකුණු 15 බැගිනි.)